**සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගම - 2020**

------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 වියාචනය කල මතය

සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ (සමාගම) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2016 අප්‍රේල් 01 දිනට බැංකු ශේෂයෙහි රු.278,519ක් වූ නොසැසඳු වෙනස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී යොමු කර ඇති ගැටළුව පරීක්ෂා කර නිවැරදි කරනු ලැබේ. | නොසැසඳු වෙනස්කම් නිරවුල් කළ යුතුය. |
| (ආ)2020 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණය හිමි ශේෂයට ඇතුළත් කර ඇති ඍණ ශේෂයන් හේතුවෙන් වෙළඳ ණය හිමි වටිනාකම රු.1, 036,479කින් ඌණගණනය වී තිබුණි. | ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී යොමු කර ඇති ගැටළුව පරීක්ෂා කර නිවැරදි කරනු ලැබේ. | ඍණ ශේෂයන් ලෙස දක්වා ඇති ණයහිමි ශේෂයන් විශ්ලේෂණය කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ශේෂයන් දැක්විය යුතුය. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) ආදායම | 59,183,024 | ඉන්වොයිසි, ඉදිකිරීම් රෙජිස්ටරය, ප්‍රමාණ පත්‍ර, කොන්ත්‍රාත් ගිවිසුම්, කළ වැඩ වාර්තා හා ස්ථාවර තැන්පතු සහතික | ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී යොමු කර ඇති ගැටළුව පරීක්ෂා කර නිවැරදි කරනු ලැබේ. | වටිනාකම තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය. |
| (ii) වියදම | 23,418,395 | ගෙවීම් වවුචර්, ඉන්වොයිසි සහ භාණ්ඩ ලැබීම් පත්‍රිකා | -එම- | -එම- |
| (iii) ගෙවිය යුතු දෑ | 223,057,870 | ඉනිවොයිසි, කොන්ත්‍රාත් ගිවිසුම් | -එම- | -එම- |
| (iv) වත්කම් | 181,899,900 | ගෙවීම් වවුචර් සහ ඉන්වොයිස් | -එම- | -එම- |

### 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

#### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද එකතුව රු.5,218,061ක් වූ ලැබිය යුතු ශේෂ හතරක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී යොමු කර ඇති ගැටළුව පරීක්ෂා කර නිවැරදි කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

#### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වසරේ සිට ඉදිරියට ගෙන එන ලද රු.27,750ක් වූ හඳුනා නොගත් තැන්පතු, රු.14,250ක් වූ සභාපතිවරයාට ගෙවිය යුතු වැටුප සහ 2019 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එන ලද රු.1,542,115ක වටිනාකමින් යුතු උපදේශන ගාස්තු, උපචිත වියදම් වල ඇතුළත් වුවද 2020 දෙසැම්බර් 31 වන විටත් සැසඳීම් කර නිරවුල් කර නොතිබුණි. | ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී යොමු කර ඇති ගැටළුව පරීක්ෂා කර නිවැරදි කරනු ලැබේ. | ශේෂයන් සැසඳීම් කිරීමට හා නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ)2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| (i) 5.1 වගන්තිය | 2012 වර්ෂයේ සිට සමාගම විසින් සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි. | ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී යොමු කර ඇති ගැටළුව පරීක්ෂා කර නිවැරදි කරනු ලැබේ. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 5.2.5 වගන්තිය | වාර්ෂික අයවැය සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (iii) 7.4.1 වගන්තිය | සමාගම විසින් විගණන කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv)9.2 වගන්තිය | සමාගම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩල සංඛ්‍යා සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | -එම- | --එම- |
| (ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | -එම- | --එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,860,219ක අලාභයක් වූ ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.570,924ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,431,143ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පරිපාලන හා ආයතනික වියදම් රු.9,717,297කින් අඩුවීමට ප්‍රතිවිරුද්ධව ශුද්ධ ආදායම සහ ශුද්ධ මූල්‍ය ආදායම රු.14,171,553කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක පිහිටා ඇත. කෙසේ වුවද, ගොඩනැගිල්ල සඳහා කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී යොමු කර ඇති ගැටළුව පරීක්ෂා කර නිවැරදි කරනු ලැබේ. | සමාගම පිහිටා ඇති ගොඩනැගිල්ල සඳහා කුලී ගිවිසුමකට එළඹිය යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහ පාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගනණ නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ පීඊඩී/12 හි 6.5.1 වගන්තියට අනුව, සමාගමේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මාස 27ක ප්‍රමාදයකින් පසු 2023 ජූනි 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වසර සඳහා ගිණුම් සැකසීමේදී යොමු කර ඇති ගැටළුව පරීක්ෂා කර නිවැරදි කරනු ලැබේ. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |